# (ඵ) සේවා නියුක්තිය සහ කම්කරු සම්බන්ධතා

## (අ) හැඳින්වීම

රැකීරක්ෂා සහ කම්කරු සම්බන්ධතා පිළිබඳ දැනට පවත්නා දත්තයන්ගෙන්, රටේ පවත්නා සේවා නියුක්ති තත්ත්වය විදහා දක්වෙන්නේ සුළු වශයෙන් පමණි. දැනට ස්ථිර පදනමක් යටතේ ලැබෙන්නේ, පහත සඳහන් දත්තයන් පමණි. රැකීරක්ෂා කාර්යාලයන් මගින් රැකියා සපයා දුන් අයගේ සංඛ්‍යා සහ රැකියා කාර්යාලවල රැකියා සහ වඩා යහපත් රැකියා අපේක්ෂාවෙන් ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාය. මෙම සංඛ්‍යා තොරතුරුවලට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොදු අංශයේ සේවා නියුක්ති තත්ත්වය මැන බැලීම සඳහා වාර්ෂිකව සමීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙයටත් අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ ලේඛනවලින් සේ: අ: අ:[1] යටතේ ලියාපදිංචි වී ඇති සේවකයන් සම්බන්ධ තොරතුරු ලබා ගනියි. මේ සම්බන්ධයෙන් දැනට පවත්නා අළුත්ම සංඛ්‍යා තොරතුරු 1968 වර්ෂය සඳහා වෙයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොදු අංශය අළලා වාර්ෂිකව පවත්වනු ලබන සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයට අනුව, රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සේවකයින් ගේ සංඛ්‍යාව සියයට 2·8 කින්ද, අර්ධ–රාජ්‍ය ආයතනවල සේවක සංඛ්‍යාව සියයට 8·3 කින්ද වැඩිවී ඇත.

1967 වර්ෂය හා සසඳන කළ, සේ: අ: අ: යටතේ, ලියා පදිංචිවී ඇති සේවකයින්ගේ ගණන 1968 දී, සියයට 5·3 ඉහළ නැගිණි. කෙසේ නමුත්, 1965–68 කාලඡේදය තුළදී, මෙම ක්‍රමය යටතේ ලියා පදිංචිවූ සේවකයින්ගේ සංඛ්‍යාව සියයට 6·8 ක සාමාන්‍ය අනුපාතයකින් වැඩි වී ඇත.

## (ආ) රැකියා ලබා දුන් සංඛ්‍යාව

1960 සිට 1970 දක්වා රැකීරක්ෂා කාර්යාල මගින් රැකියා ලබා දුන් අයගේ සංඛ්‍යා, වාර්ෂික වශයෙන්, II (ඵ) 1 සංඛ්‍යා සටහනේ දැක්වේ.

### II (ඵ) 1 වන සංඛ්‍යා සටහන

**රැකියා ලබා දෙනු ලැබූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව සහ එක් එක් වර්ගය යටතේ, ලියාපදිංචිවී ඇති මුළු සංඛ්‍යාවට එහි ඇති සාපේක්ෂ වැදගත්කම**

| වර්ෂය | කාර්මික සහ ලිපිකරු | | පුහුණු | | අර්ධ – පුහුණු | | නුපුහුණු | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සේවා ලබාදුන් සංඛ්‍යාව | වර්ගය යටතේ ලියාපදිංචි වූ අයගෙන් සියයට ගණන | සේවා ලබාදුන් සංඛ්‍යාව | වර්ගය යටතේ ලියාපදිංචි වූ අයගෙන් සියයට ගණන | සේවා ලබාදුන් සංඛ්‍යාව | වර්ගය යටතේ ලියාපදිංචි වූ අයගෙන් සියයට ගණන | සේවා ලබාදුන් සංඛ්‍යාව | වර්ගය යටතේ ලියාපදිංචි වූ අයගෙන් සියයට ගණන | සේවා ලබාදුන් සංඛ්‍යාව | ලියාපදිංචි වූ අයගෙන් සියයට ගණන |
| 1960 | 1,400 | 5·3 | 771 | 4·6 | 1,247 | 3·6 | 4,744 | 6·5 | 8,162 | 5·4 |
| 1961 | 1,259 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2,794 | 3·9 | 5,648 | 3·7 |
| 1962 | 1,263 | 3·7 | 468 | 2·7 | 809 | 2·3 | 2,315 | 3·5 | 4,857 | 3·2 |
| 1963 | 1,322 | 3·7 | 502 | 3·0 | 836 | 2·3 | 2,466 | 3·9 | 5,129 | 3·4 |
| 1964 | 1,722 | 4·4 | 535 | 3·2 | 945 | 2·5 | 3,599 | 5·5 | 6,801 | 4·3 |
| 1965 | 1,495 | 2·7 | 846 | 4·2 | 1,035 | 2·1 | 3,753 | 5·0 | 7,129 | 3·6 |
| 1966 | 1,056 | 1·6 | 740 | 3·4 | 917 | 1·5 | 4,089 | 4·5 | 6,802 | 2·9 |
| 1967 | 1,018 | 1·4 | 588 | 2·5 | 712 | 1·1 | 1,936 | 2.1 | 4,254 | 1·7 |
| 1968 | 680 | 0·9 | 780 | 3·1 | 794 | 1·1 | 2,696 | 2·6 | 4,950 | 1·8 |
| 1969 | 865 | 1·0 | 710 | 2·3 | 800 | 0·9 | 2,908 | 2·1 | 5,283 | 1·5 |
| 1970* | 526 | 0·5 | 584 | 1·5 | 428 | 0.4 | 1,287 | 0·7 | 2,825 | 0·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලිකයි.

1 "ආවෘත", සේවා නියුක්තින් මගින් සේ. අ. අ. අධිකාරී වෙත තොරතුරු සපයනු ලැබේ. දැනට "ආවෘත" සේවා නියුක්තින්, වතුවල සේවකයින් 5 හෝ ඊට වැඩි සහ වතු නොවන අනිකුත් ආයතනවලට සේවකයින් 3 ක් හෝ ඊට වැඩි ගණනක් සේවයේ යොදවා ඇති ආයතනවලින් යුක්ත වේ. කෙසේ වෙතත්, අනුමත කළ අර්ථසාධක අරමුදල්වලට දායක වන සේවා යෝජකයන් මෙහි අඩංගු නොවේ.

රැකීරක්ෂා කාර්යාල මගින් රැකියාවන් ලබා දුන් පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාව 1969 දී 5,283 සිට 1970 දී 2,825 දක්වා පහළ වැටිණි. නුපුහුණු වශයෙන් වර්ග කොට ඇති කාණ්ඩයේ 1970 වර්ෂයේ සිදුවූ පහළ වැටීම සියයට 55 කටත් වඩා අධික විය. අර්ධ–පුහුණු සහ කාර්මික හා ලිපිකරු කාණ්ඩයන්හි සිදුවූ පහළ වැටීම පිළිවෙලින් සියයට 47 සහ සියයට 39 ක් විය.

**(ඈ) පොදු අංශයේ සේවා නියුක්තිය**

ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ දෙපාර්තමේන්තුවල සහ අර්ධ-රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් පවත්වනු ලැබේ. (රජයේ සංස්ථාවන් විශ්ව විද්‍යාල, ,පර්යේෂණ ආයතන, මණ්ඩල යනාදිය) 1969 දී මෙම විමර්ශනයට රජයේ දෙපාර්තමේන්තු 96 කින් සහ අර්ධ රාජ්‍ය ආයතන 55 කින් පිළිතුරු සැපයිණි. 1970 දී මහ බැංකුව විසින් ඉල්ලා සිටි සංඛ්‍යා තොරතුරු රජයේ දෙපාර්තමේන්තු 107 සහ අර්ධ- රාජ්‍ය ආයතන 65 විසින් සපයන ලදී. මෙම විමර්ශනයේදී සංඛ්‍යා තොරතුරු නොසපයන ලද රජයේ දෙපාර්තමේන්තු සඳහා 1969/70 රජයේ ආදායම් සහ වියදම් ඇස්තමේන්තුවල දක්වෙන සේවක සංඛ්‍යා තොරතුරු අනුව බොහෝ දුරට ඇස්තමේන්තු කොට, ලබා ගන්නා ලදී.

පොදු අංශයේ නියුක්ත සේවකයින්, සේවා තත්ත්වය අනුව වර්ග කොට ඇත. එනම්, පහත දක්වෙන වෘත්තීන් ගණයන්ට අනුව, ස්ථිර, තාවකාලික, අනියම් වශයෙනි.

( i ) මාණ්ඩලික ශ්‍රෙණියේ පරිපාලන, කාර්මික සහ වෘත්තීය නිලධාරීන්.

( ii ) සහායක සේවකයින්.

( iii ) සුළු සේවකයින්.

( iv ) අනෙකුත් සේවකයින්.

**රජයේ දෙපාර්තමේන්තු**

1969 සහ 1970 වර්ෂයන් සඳහා රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්තිය පිළිබඳ ඇස්තමේන්තු II (එ) 2 සටහනින් දක්වා ඇත.

සමාලෝචනයට භාජනව ඇති දෙවර්ෂය තුළදී රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සේවකයින්ගේ මුළු සංඛ්‍යාවෙන් සියයට 91 පමණ සහායක හා සුළු සේවක ගණයන්ට අයත් විය. 1970 වර්ෂයේ සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාවෙන් සහාය සේවකයින් සියයට 37 ක් වූ අතර, සුළු සේවකයින් සියයට 54 ක් විය. ඉකුත් වර්ෂවල මෙම සේවක ගණයන් දෙක සඳහා වූ අදළ සියයට ගණන් ප්‍රමාණයන් නොවෙනස්ව පැවතිණ. රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්තවී සිටි මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 4 ක් 1969 සහ 1970 යන දෙවර්ෂයේම පරිපාලන, කාර්මික හා වෘත්තීමය ශ්‍රෙණීන්වලට අයත් විය.

පහත සඳහන් සංඛ්‍යා සටහනින්, රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සේවකයින්ගෙන් වැඩි දෙනෙක් ස්ථිර සේවකයින්ගේ ගණයට අයත් විය. 1970 වර්ෂයේ රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නිරතවූවන්ගේ මුළු සංඛ්‍යාවෙන් සියයට 79 ස්ථිර පදනමක් යටතේ සේවයේ නිරතව සිටියහ. 1969 වර්ෂය සඳහා අනුරූපී සංඛ්‍යාව සියයට 79 කි. ඉකුත් වර්ෂ දෙකේදී, සේවකයින් ගෙන් සියයට 6 ක් පමණ තාවකාලික සේවකයින්ගේ ගණයට අයත් විය. 1969 ට වඩා 1970 දී, මුළු සේවා නියුක්ති ප්‍රමාණයෙන්, අනියම්

## II (එ) 2 වන සංඛ්‍යා සටහන

## සේවා නියුක්ති සංඛ්‍යාව - රජයේ දෙපාර්තමේන්තු

| රැකියා වර්ගය | සේවා තත්වය සහ සේවක සංඛ්‍යාව | | | | | | | | 1969 අනුව වෙනසෙහි සියයට ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | | තාවකාලික | | අනියම් | | එකතුව | | |
| | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 | |
| 1· පරිපාලන, ශිල්පීය, වෘත්තීය, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරි · | 8,240 | 8,800 | 347 | 483 | 4 | 6 | 8,591 | 9,289 | + 8·1 |
| 2· සහාය සේවකයන් ·· | 77,512 | 79,674 | 1,580 | 1,724 | 1,056 | 1,453 | 80,148 | 82,851 | + 3·4 |
| 3· සුළු සේවකයන් ·· | 76,567 | 78,127 | 10,516 | 9,844 | 30,644 | 32,387 | 117,727 | 120,358 | + 2·2 |
| 4· අනෙකුත් ·· | 11,265 | 11,465 | 399 | 365 | 485 | 489 | 12,149 | 12,319 | + 1·4 |
| එකතුව ·· | 173,584 | 178,066 | 12,842 | 12,416 | 32,189 | 34,335 | 218,615 | 224,817 | + 2·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* සංලක්ෂය:

1. (i) ව්‍යවස්ථාදායක නිලධාරිහු සහ රජයේ පරිපාලකයන්.
   (ii) කළමනාකාර, සභාපති සහ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්.
   (iii) විද්‍යාඥයෝ, කාර්මිකයෝ සහ ඉංජිනේරුවෝ, වෛද්‍යවරු, මහාචාර්යවරු, සහ කථිකාචාර්යවරු, ගණකාධිකාරිවරු, තක්සේරුකරුවෝ.
2. (i) ලිපිකරු ශ්‍රේණි, සරප්වරු, ලඝුලේඛකයෝ, යතුරු ලේඛකයෝ, සයිෆර් ක්‍රියාකරවන්නෝ.
   (ii) දුරකථන සේවකයෝ සහ කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, පරිවර්තකයෝ, ව්‍යාප්ති පරීක්ෂණ සහ විමර්ශන සේවකයෝ, පොලිස් සහ ග්‍රාම සේවක.
   (iii) ගබඩාකරුවෝ.
3. (i) පණිවුඩකරුවෝ, කාර්යාල කාර්ය සහායක සහ ඔඩලිවරු, රියදුරු (මෝටර් රථ හා ලොරි ආදිය).
   (ii) පුහුණු කම්කරුවෝ.

සේවකයින්ගේ ප්‍රමාණය සාපේක්ෂ ලෙස සුළු වශයෙන් වැඩි විය. මෙයට හේතුව වශයෙන් පෙනී යන්නේ විවිධ රජයේ දෙපාර්තමේන්තුවල අනියම් පදනම යටතේ සේවයෙහි නිරතවූ සේවකයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩිවීමය.

1970 වර්ෂයේදී, රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සේවකයින්ගේ මුළු ගණන සියයට 2·8 කින් වැඩි විය. වැඩිම ප්‍රමාණයකින් සේවකයින්ගේ සංඛ්‍යාව ඉහළ ගියේ පරිපාලන, කාර්මික හා වෘත්තීමය ශ්‍රේණීන්වලය. 1970 දී මෙම ගණයන්ට ඇතුළත් වූ සේවකයින්ගේ ප්‍රමාණය සියයට 8 තරම්වූ ප්‍රමාණයකින් ඉහළ නැගිණි. සහායක සේවකයින් සම්බන්ධයෙන්, සේවයේ යෙදී සිටි මුළු සේවක සංඛ්‍යාවේ වැඩිවීම සියයට 3·4 ක් වූ අතර සුළු සේවක ගණයේ වැඩිවීම සියයට 2·2 ක් විය.

### අර්ධ -රාජ්‍ය ආයතන

අර්ධ - රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය පිළිබඳ ඇස්තමේන්තු පහත දැක්වෙන II (එ) 3 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

## II (එ) 3 වැනි සංඛ්‍යා සටහන

### සේවා නියුක්ති සංඛ්‍යා - අර්ධ-රාජ්‍ය ආයතන*

| රැකියා – වර්ගය | සේවා තත්වය හා සේවක සංඛ්‍යාව | | | | | | | | 1969 අනුව වෙනසෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | | තාවකාලික | | අනියම් | | එකතුව | | |
| | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 | |
| 1. පරිපාලන, ශිල්පීය සහ මාණ්ඩලික ශ්‍රෙනියේ වෘත්තීය නිලධාරීන් .. | 5,212 | 5,793 | 301 | 305 | 47 | 46 | 5,560 | 6,144 | + 10·5 |
| 2 සහාය සේවකයින් .. | 26,911 | 29,175 | 357 | 764 | 410 | 433 | 27,678 | 30,372 | + 9·7 |
| 3. සුලු සේවකයින් .. | 77,570 | 82,568 | 7,244 | 9,125 | 25,982 | 27,767 | 110,796 | 119,460 | + 7·8 |
| 4. අනෙකුත් .. | 5,860 | 6,691 | 200 | 228 | 3,832 | 3,850 | 9,892 | 10,769 | + 8·9 |
| එකතුව .. | 115,553 | 124,227 | 8,102 | 10,422 | 30,271 | 32,096 | 153,926 | 166,745 | + 8·3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සංලක්ෂය:

1. (i) ව්‍යවස්ථාදයක නිලධාරීහු හා රජයේ පරිපාලකයෝ.
   (ii) කළමනාකාර, සභාපති සහ අනෙකුත් මාණ්ඩලික ශ්‍රෙණියේ නිලධාරීහු.
   (iii) විද්‍යාඥයෝ, කාර්මිකයෝ සහ ඉංජිනේරුවෝ, වෛද්‍යවරු, මහාචාර්යවරු සහ කථිකාචාර්යවරු, ගණකාධිකාරිවරු, තක්සේරුකරුවෝ.
2. (i) ලිපිකරු ශ්‍රෙණි, සරප්වරු, ලඝුලේඛකයෝ, යතුරු ලේඛකයෝ සහ සයිෆර් ක්‍රියාකරවන්නෝ.
   (ii) දුරකථන සේවකයෝ සහ කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, පරිවර්තකයෝ, ව්‍යාප්ති පරීක්ෂකයෝ හා විමර්ශන නිලධාරීහු, පොලිස් නිලධාරීහු සහ ග්‍රාම සේවකයෝ
   (iii) ගබඩා භාරකරුවෝ.
3. (i) පණිවුඩකරුවෝ, කාර්යාල කාර්ය සහායකයෝ, උපස්ථායක සහ ඔඩලිවරු, රියදුරු (මෝටර් රථ හා ලොරි ආදිය) නුපුහුණු කම්කරුවෝ, අඩ පුහුණු කම්කරුවෝ.
   (ii) පුහුණු කම්කරුවෝ.

* පොදු සමායතන, විශ්ව විද්‍යාල, සංයුක්ත මණ්ඩල යනාදිය.

1970 දී අර්ධ-රාජ්‍ය ආයතනවල සේවා නියුක්තියේ ස්වරූපය සම්පූර්ණයෙන්ම වාගේ 1969 වර්ෂයේ පැවති ස්වරූපය හා සමාන විය. සහාය සහ සුළු සේවක ශ්‍රෙණීන්වල සේවක සංඛ්‍යාව, සේවයේ නියුක්තවී සිටි මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 90 ක් විය. අර්ධ-රාජ්‍ය ආයතනයන්හි කැපීපෙනෙන ලක්ෂණය වූයේ සුළු සේවකයින්ගේ සංඛ්‍යාව, අනෙකුත් සේවකයින්ගේ සංඛ්‍යාවට වඩා විශාල වීමය. මෙම ආයතනයන්හි සේවයේ නියුක්ත වී සිටි මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 72 ක් පමණ සුළු සේවක ශ්‍රෙණියට අයත් විය. මෙයට හේතුව වී ඇත්තේ අර්ධ-රාජ්‍ය ආයතන අතුරෙන් බොහොමයක් කාර්මික ව්‍යවසායන්වීම නිසා පුහුණු සහ නුපුහුණු කම්කරුවන්, දෙවර්ගයම විශාල සංඛ්‍යාවක් සේවාවෙහි යොදවා තිබීමය. 1969 සහ 1970 දෙවර්ෂයේම, පරිපාලන, කාර්මික සහ වෘත්තීමය ශ්‍රෙණීන්වලට අයත් සේවකයින්, මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 4 ක් විය.

1970 වර්ෂයේ අර්ධ-රාජ්‍ය ආයතනවල සේවකයින්ගෙන් සියයට 75 පමණ, ස්ථිර සේවකයන්ගේ ගණයට ද; සියයට 19 අනියම් සේවකයින්ගේ ගණයට සහ සියයට 6 ක් තාවකාලික සේවකයින්ගේ ගණයටද අයත් විය. පසුගිය වර්ෂයේද, සේවකයින් ඒ ඒ ශ්‍රෙණීන් අතර බෙදී පැවතියේ මේ හා සමාන ආකාරයකටය.

1970 වර්ෂයේ අර්ධ-රාජ්‍ය ආයතනවල සේවයේ නියුක්තවූ මුළු සේවක සංඛ්‍යාව 1969 වර්ෂයට වඩා සියයට 8·3 කින් අධික විය. ඒ ඒ වෘත්තීමය සේවක ගණයන්හි නියුතු සේවකයන්ගේ සංඛ්‍යාවේ වැඩිවීම එම මට්ටමේම පැවතින. එහෙත්, පරිපාලන, කාර්මික සහ වෘත්තීමය ශ්‍රෙණීන්වලට අදළ සේවක සංඛ්‍යාව අනික් ශ්‍රෙණීන්වල සේවක සංඛ්‍යාවේ

වැඩීවීමේ වේගයට වඩා වැඩි වේගයකින් වැඩිවිය (සියයට 10·5). නියම වශයෙන් සලකා බලන කල පෙනී යනුයේ සේවාවල නියුක්තවූවන්ගේ සංඛ්‍යාවේ විශාලතම වැඩිවීම සිදු වී ඇත්තේ සුළු සේවක ශ්‍රේණියේ බවය.

**(ඈ) සේ: අ: අ: යටතේ ලියා පදිංචිවූ සේවකයින්**

සේ: අ: අ: යටතේ ලියා පදිංචි වූවන්ගේ අළුත් ම සංඛ්‍යා තොරතුරු ඇත්තේ 1968 වර්ෂය සඳහාය. සේ: අ: අ: යටතේ ලියාපදිංචිවූවන් ප්‍රධාන කාර්මික ගණයන්ට අනුව බෙදී ගිය ආකාරයට වර්ගකොට ඇත. 1965 සිට 1968 දක්වා වූ වර්ෂ සඳහාවූ මෙම සංඛ්‍යා පහත දක්වා ඇත.

## II (එ) 4 වන සංඛ්‍යා සටහන

### සේ. අ. අ. යටතේ ලියාපදිංචි වී ඇති සේවක සංඛ්‍යාව

| | වර්ෂාවසානය වන විට ලියාපදිංචි වී සිටි සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 1965 | 1966 | 1967 | 1968 |
| 1. අපනයන කෘෂිකාර්මික කටයුතු .. | 1,072,892 | 1,126,829 | 1,191,585 | 1,246,138 |
| 2. අනෙකුත් කෘෂිකාර්මික කටයුතු .. | 1,973 | 3,355 | 3,734 | 4,743 |
| 3. පතල් සහ කැනීම් කටයුතු .. | 1,528 | 2,443 | 2,903 | 2,968 |
| 4. නිෂ්පාදන කටයුතු .. | 111,168 | 143,520 | 160,839 | 174,187 |
| 5. තැනීම් කටයුතු .. | 15,111 | 17,026 | 18,929 | 24,890 |
| 6. වෙළඳ සහ ගමනාගමන .. | 135,174 | 148,787 | 163,574 | 176,502 |
| 7. සේවා කටයුතු .. | 76,484 | 83,429 | 92,458 | 99,452 |
| 8. වර්ග නොකල* .. | 15,735 | 17,762 | 18,930 | 11,388 |
| එකතුව . | 1,430,065 | 1,543,151 | 1,652,952 | 1,740,268 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* දෝෂ සහ අතැරීම් ඇතුළත්ය.

සංලක්ෂය; සංඛ්‍යා බොහෝ දුරට තාවකාලිකය.

(i) රැස්වාවෙන් ඉවත් වූවද, සේවක අර්ථසාධක අරමුදලේ බැර ශේෂයන් දිගටම පවත්වා ගෙන යනු ලබන සේවකයින්.

(ii) අනුමත කළ අර්ථසාධක අරමුදල් ඇති වෘත්තීන්හි සේවකයන්ගේ සේවා නියුක්ති සංඛ්‍යා තොරතුරු මෙහි ඇතුළත් නොවේ.

(iii) දනට වෙනත් කිසිදු සවිස්තරාත්මක තොරතුරු නොමැතිකම නිසා, බොහෝ අවස්ථාවලදී ආයතනයේ සවභාවයෙන් එම ආයතනය අයත් වන කර්මාන්තයේ නියම ස්වභාවය නිරූපනය නොවීම නිසා, උපයෝගී කොට ඇති 'කර්මාන්තය' අනුව වර්ග කිරීම මේ නිසා බොහෝ දුරට දළ වර්ග කිරීමක් වේ.

1968 අවසානය වන විට ලියාපදිංචි වී සිටි සේවකයින්ගෙන් සියයට 72 කෘෂිකාර්මික කටයුතුවල ද, සියයට 10 නිෂ්පාදන කටයුතුවලද, සියයට 10 ක් වෙළඳ හා ගමනාගමන කටයුතුවල ද නිරත වූවන් විය. සේ: අ: අ: යටතේ 1967 වර්ෂයේ අවසානය වන විට ලියාපදිංචි වී සිටි සේවකයින් ඒ ඒ කාර්මික ගණයන් අතර බෙදී පැවතියේ මේ අන්දමේ සාමාන්‍ය ස්වරූපයකින්ය.

1967 හා සසඳනකළ සේ. අ. අ. යටතේ ලියා පදිංචිවූවන්ගේ සංඛ්‍යාව 1968 වර්ෂයේදී සියයට 5·3 කින් ඉහළ නැගිණි. ඉකුත් වර්ෂ දෙක සඳහා ලියාපදංචි වූවන්ගේ සංඛ්‍යාවේ වැඩිවීම සියයට 7·9 (1965 වඩා 1966 දී) සහ සියයට 7·1 (1966 වඩා 1967) විය. 1965-1968 මුළු කාලච්ඡේදය සඳහා ලියාපදිංචිවූ සේවකයින්ගේ සාමාන්‍ය වැඩිවීම සියයට 6·8 විය. 1968 වර්ෂයේ වැඩියෙන්ම ලියාපදංචිවී ඇත්තේ, අනෙකුත් කෘෂිකාර්මික කටයුතුවල නියුතු සේවකයින් (සියයට 27 ක්) සහ තැනීම් කටයුතුවල නියුතු සේවකයින්ය (සියයට 32). නිෂ්පාදන කටයුතුවල නියුතු සේවකයින් (සියයට 8·3) වෙළඳ හා පරිවාහන කටයුතුවල නියුතු සේවකයින් (සියයට 7·9) සහ සේවා කටයුතුවල නියුතු සේවකයින් (සියයට 7·6) වශයෙන් ලියාපදිංචිවී ඇති සේවකයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු පරිදි වැඩිවී ඇති බව පෙනී යයි.

ii (එ) 5 සංඛ්‍යා සටහන 1968 වර්ෂාවසානය වන විට සේ. අ. අ. යටතේ ලියා පදිංචිවූ සේවකයින්, කර්මාන්ත සහ දිස්ත්‍රික්ක අනුව බෙදී ගිය ආකාරය පෙන්වයි.

## II (එ) 5 වන සංඛ්‍යා සටහන

### දිස්ත්‍රික්කය හා කර්මාන්තය අනුව, සේ. අ. අ. යටතේ ලියාපදිංචි වූ සේවක සංඛ්‍යාව දක්වන සේවා නියුක්ති මැට්‍රිකය - 1968.

වර්ෂය අවසානයේ සංඛ්‍යා

| කර්මාන්ත \ දිස්ත්‍රික්කය | කොළඹ | කෑගල්ල | මාතර | රත්නපුර | මහනුවර | නුවරඑළිය | කළුතර | යාපනය | පුත්තලම හා හලාවත | කුරුණෑගල | බදුල්ල | ගාල්ල | වව්නියාව | මාතලේ | අනුරාධපුර | හම්බන්තොට | ත්‍රිකුණාමලය | මඩකලපුව | පොළොන්නරුව | මොණරාගල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| I අපනයන කෘෂිකර්මය .. | 26,329 | 98,717 | 90,694 | 174,434 | 266,929 | 159,260 | 76,152 | 229 | 15,232 | 36,812 | 162,583 | 94,539 | – | 43,592 | – | – | 113 | 523 | – | – | 1,246,138 |
| II අනෙකුත් කෘෂිකර්මය .. | 1,472 | 28 | 52 | 55 | – | 5 | – | 83 | 8 | – | 201 | 1,773 | 52 | – | 239 | 602 | – | 144 | 19 | 10 | 4,743 |
| III පතල් හා ගල් කැනීම .. | 2,255 | – | – | – | – | – | 54 | – | – | 616 | – | – | – | 43 | – | – | – | – | – | – | 2,968 |
| IV නිෂ්පාදනය .. | 125,622 | 1,114 | 2,163 | 640 | 5,433 | 405 | 212 | 3,456 | 12,386 | 10,101 | 1,689 | 5,906 | 98 | 2,107 | 458 | 372 | 456 | 857 | 585 | 127 | 174,187 |
| V තැනීම් .. | 12,315 | 266 | 69 | 309 | 3,466 | 226 | 5,264 | 237 | 39 | 292 | 1,201 | 306 | 20 | 216 | 19 | – | 116 | 71 | 446 | 12 | 24,890 |
| VI වෙළෙඳාම හා ගමනාගමනය .. | 108,845 | 4,389 | 1,838 | 4,211 | 11,996 | 5,136 | 3,991 | 4,264 | 2,946 | 6,370 | 7,682 | 1,627 | 701 | 1,671 | 1,669 | 1,022 | 3,365 | 2,812 | 1,500 | 467 | 176,502 |
| VII සේවා .. | 55,060 | 1,508 | 2,405 | 2,123 | 6,368 | 1,271 | 2,414 | 2,208 | 826 | 2,381 | 2,968 | 10,097 | 263 | 1,713 | 1,254 | 582 | 3,287 | 2,226 | 348 | 150 | 99,452 |
| VIII වර්ග නොකළ .. | 7,285 | 795 | 4,656 | 1,648 | 31 | 2,383 | 1,415 | 1,321 | 58 | 1,430 | –10,433 | 1,440 | – 25 | – 720 | 50 | – 10 | – 12 | –404 | 10 | 470 | 11,388 |
| එකතුව .. | 339,183 | 106,817 | 01,877<br>1 | 183,420 | 294,223 | 168,686 | 89,502 | 11,798 | 31,495 | 58,002 | 165,891 | 115,688 | 1,109 | 48,622 | 3,689 | 2,568 | 7,325 | 6,229 | 2,908 | 1,236 | 1,740,268 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* වැරදීම් හා අත්හැරීම් ද ඇතුළුව.

සංලක්ෂය: (අ) සේ: අ: අ: යටතේ ලියාපදිංචි කළ සේවකයන්ගේ සංඛ්‍යාව හා සම්බන්ධ සංඛ්‍යාවන්ය.

(ආ) සංඛ්‍යා තාවකාලිකයි.

(i) සේවාවෙන් ඉවත්වූ නමුත් තවමත් සේවක අර්ථසාධක අරමුදලෙහි බැර ශේෂයන් ඇති සේවකයන් ගැනේ.

(ii) අනුමත කළ අර්ථසාධක අරමුදල් ඇති කර්මාන්තයන්හි සේවා නියුක්තිය මේවාට ඇතුළත් නොවේ.

(iii) කර්මාන්තය අනුව වර්ග කිරීමේ පදනම වූයේ, සේවකයාගේ කර්මාන්තයෙහි ස්වභාවයයි. ලබාගතහැකි වෙනත් තොරතුරක් නොමැතිවූ විට ආයතනයෙහි නමින් දක්වුනු පරිදි බොහෝවිට කර්මාන්තයේ නමින් එහි නියම ස්වභාවය හෙළි නොවිය. මේ අනුව බලනකළ මෙය දළ වර්ගීකරණයක් පමණක් වෙයි

1968 වර්ෂාවසානය වනවිට, ලියාපදිංචි සේවකයින්ගෙන් සියයට 19 ක් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වෘත්තීන්වලද, සියයට 17 ක් නුවරද, සියයට 11 රත්නපුරද, සියයට 10 ක් නුවරඑළියද, සියයට 10 ක් බදුල්ලද, සියයට 7 ගාල්ල සහ සියයට 6 ක් කෑගල්ලද විය. 1967 වර්ෂය හා සසඳා බලන කළ 1968 වර්ෂයේ දී ඒ ඒ දිස්ත්‍රික්ක හා කර්මාන්ත අතර සේවකයින් බෙදී යාම ඒ ආකාරයට නොවෙනස්ව පැවතිණ. අපේක්ෂිත ආකාරයට කොළඹ දිස්ත්‍රික්කයේ සේවාවල නියුතු සේවකයින්ගෙන් වැඩිම සේවක සංඛ්‍යාවක් නිෂ්පාදන කටයුතුවලද (සියයට 37), වෙළඳ හා පරිවහන කටයුතුවල (සියයට 32) සහ සේවා කටයුතුවල (සියයට 16) නිරත විය. අනෙකුත් දිස්ත්‍රික්කයන්හි සේවාවල නියුක්තවූ සේවකයින්ගෙන් වැඩි කොටසක්, වැවිලි කටයුතුවල නිරතවූ සේවකයන් විය. මෙම සංඛ්‍යා සටහනින් පැහැදිලි වන තවත් කරුණක් වන්නේ, බොහොමයක් දිස්ත්‍රික්කවල, තැනීම් කටයුතු, වෙළඳ හා පරිවහන සහ සේවා කටයුතු ආදී වෘත්තීන් අතර සේවකයින් බෙදී ගිය ආකාරය ඉකුත් වර්ෂයේ මෙන් සිදුවී ඇති බවය.

**(ඉ) රැකියා සඳහා ලියා පදිංචි වූවන්**

ඉකුත් වර්ෂයේ අවසානයේ රැකියා අපේක්ෂාවෙන් ලියා පදිංචි වූ 341,286 හා සසඳා බලන කළ 1970 දෙසැම්බර් මස අවසාන වන විට ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යා 410,746 විය. 1970 කාර්මික හා ලිපිකරු රැකියාවන් අපේක්ෂාවෙන් ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂයේ වැඩි වූ 10,000 අනුව සලකන කළ මෙම වර්ෂයේ 13,300 කින් පමණ වැඩිවිය. පුහුණු සේවකයන්ගේ වර්ගය යටතේ ලියාපදිංචි පුද්ගලයින්ගේ සංඛ්‍යාව 1970 දී ආසන්න වශයෙන් 6,700 පමණ විය. මෙම සංඛ්‍යාව 1969 වර්ෂයේ ලියාපදිංචි සංඛ්‍යාවට වඩා තුන් ගුණයකටත් වඩා වැඩිවිය. නුපුහුණු සේවකයන් වශයෙන් ලියාපදිංචි පුද්ගලයන්ගේ සංඛ්‍යාව 1969 දී සහ 1970 දී පිළිවෙලින් දළ වශයෙන් 33,400 සහ 34,000 විය.

### II (එ) 6 වන සංඛ්‍යා සටහන

**දිවයිනේ රැකීරක්ෂා කාර්‍යාලයන්හි පවත්වා ගෙන එනු ලබන ලේඛනයන්ට අනුව රැකියා සහ වඩා යහපත් රැකියා අපේක්ෂාවෙන් ලියාපදිංචි වූවන්ගේ ගණන**

| | කාලච්ඡේදය අවසානයේ — සංඛ්‍යා තොරතුරු | | | | |
|---|---|---|---|---|---|
| | කාර්මික සහ ලිපිකරු | පුහුණු | අර්ධ පුහුණු | නුපුහුණු | එකතුව |
| 1969 මාර්තු .. | 77,647 | 26,361 | 73,562 | 109,235 | 286,805 |
| ජූනි .. | 78,522 | 26,891 | 76,110 | 115,696 | 297,219 |
| සැප්තැම්බර් .. | 84,066 | 29,957 | 84,370 | 131,644 | 330,037 |
| දෙසැම්බර් .. | 85,814 | 31,147 | 86,492 | 137,833 | 341,286 |
| 1970 මාර්තු .. | 88,824 | 33,057 | 91,743 | 147,903 | 361,527 |
| ජූනි .. | 92,597 | 34,018 | 96,619 | 157,051 | 380,285 |
| සැප්තැම්බර් .. | 95,859 | 35,333 | 93,363 | 162,838 | 387,393 |
| දෙසැම්බර්* .. | 99,111 | 37,882 | 96,891 | 176,862 | 410,746 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

* තාවකාලිකයි

II (එ) 6 සංඛ්‍යා සටහන 1970 වර්ෂයේදී රැකියා අපේක්ෂාවෙන් ලියාපදිංචි මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 67 ක් අර්ධ-පුහුණු හෝ පුහුණු රැකියා සඳහා ලියාපදිංච්චි ඇති බව පෙන්වා දෙයි. එසේම, කාර්මික සහ ලිපිකරු රැකියා ලබා ගැනීම සඳහා ලියාපදිංචි පුද්ගලයින්ගේ අනුපාතයද ඉහළ මට්ටමක පැවතිණ. 1970 වර්ෂයේ ලියාපදිංචි මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 24 කාර්මික හා ලිපිකරු රැකියා ලබා ගැනීම සඳහා වූවන්ගේ ගණයට අයත් විය. 1969 වර්ෂයේ මෙම වර්ගය යටතේ ලියාපදිංචි වූවන්ගේ අනුරූපී සංඛ්‍යාව සියයට 27 කි.

## (ඊ) කම්කරු සම්බන්ධතා

පෞද්ගලික අංශයේ වෘත්තීන්හි හටගත් වැඩ වර්ජන සංඛ්‍යාව, එම වැඩ වර්ජනවලට සහභාගිවූ සේවක සංඛ්‍යාව සහ එම වැඩ වර්ජන හේතුවෙන් නැතිවූ මිනිස් දින ගණන පිළිබඳ සංඛ්‍යා තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුව සපයනු ලැබේ. කම්කරු දෙපාර්තමේන්තුවෙන් 1970 වර්ෂය සඳහා ලබා ගත් සංඛ්‍යා තොරතුරු II (එ) 7 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

### II (එ) 7 වන සංඛ්‍යා සටහන

### පෞද්ගලික අංශයේ වෘත්තීන්හි සිදු වූ වැඩ වර්ජන

| අවුරුද්ද | වැවිලි | | | අනෙකුත් රැකියා | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | නැතිවූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධවූ සේවක සංඛ්‍යාව | නැතිවූ මිනිස් දින ගණන |
| 1960 .. | 123 | 42,528 | 259,948 | 37 | 4,839 | 15,139 |
| 1961 .. | 90 | 29,223 | 317,866 | 39 | 38,013 | 170,372 |
| 1962 .. | 138 | 42,569 | 193,792 | 550 | 25,730 | 801,882 |
| 1963 .. | 174 | 62,511 | 359,905 | 58 | 21,819 | 479,678 |
| 1964 .. | 201 | 68,009 | 611,060 | 103 | 21,400 | 274,623 |
| 1965 .. | 175 | 70,929 | 482,259 | 55 | 10,085 | 89,952 |
| 1966 .. | 132 | 138,259 | 4,117,264 | 32 | 4,592 | 34,351 |
| 1967 .. | 194 | 74,968 | 414,636 | 36 | 14,883 | 284,709 |
| 1968 .. | 171 | 65,909 | 722,690 | 26 | 11,308 | 165,726 |
| 1969 .. | 146 | 56,861 | 406,150 | 43 | 6,317 | 58,015 |
| 1970* .. | 217 | 77,598 | 841,597 | 52 | 8,976 | 108,071 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

* තාවකාලිකයි.

1969 වර්ෂයේ වැවිලි කර්මාන්ත අංශයේ සිදුවී ඇති මුළු වැඩ වර්ජන සංඛ්‍යාව 146 විය. 1970 වර්ෂයේ, එම අංශයේ වැඩ වර්ජන 217 ක් සිදුවී ඇත. වැඩ වර්ජන සඳහා සහභාගිවූ සේවකයින්ගේ සංඛ්‍යාව 1969 වර්ෂයේ 56,800 සිට 1970 වර්ෂයේ 77,600 දක්වා ඉහළ නැගිණි. "අනෙකුත් රැකියාවල" ඉකුත් වර්ෂය හා සසඳා බලන කළ 1970 වර්ෂයේ වැඩ වර්ජන නවයක් පමණක් වැඩියෙන් සිදුවී ඇත.

වැඩ වර්ජනවලට සහභාගිවූ සේවකයින්ගේ සංඛ්‍යාව අනුව සලකා බලන කළ ප්‍රධාන යයි ගිණිය හැකි වැඩ වර්ජන සිදුවී ඇත්තේ 1970 වර්ෂයේ ප්‍රථම භාගයේදීය.